සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved



# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

## තර්ක ශාස්ත්‍රය හා විද්‍යාත්මක ක්‍රමය - I

12 ශ්‍රේණිය

කාලය පැය 02 යි.

උපදෙස් :-
- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
- එක් එක් ප්‍රශ්නයට දී ඇති පිළිතුරු අතරින් නිවැරදි පිළිතුර තෝරා ඊට අයත් අංකය වරහන් තුළ දක්වන්න.

---

(01) ''පදය'' යන්නෙහි නිවැරදි නිර්වචනය වන්නේ,

(1) ප්‍රස්තුතයක වාච්‍ය හෝ වාචකය වශයෙන් යෙදෙන වචන සමූහයයි.

(2) ප්‍රස්තුතයක වාච්‍ය හෝ වාචකය වශයෙන් යෙදෙන වචනයක් හෝ වචන සමූහයයි.

(3) ප්‍රස්තුතයක අර්ථවත් වන වචන සමූහයයි.

(4) වාක්‍යක වාච්‍යය හෝ වාචකය ලෙස යෙදෙන වචන සමූහයයි.

(5) ගුණාර්ථය හෝ වස්තු අර්ථය හැඟවෙන වචන සමූහයයි. (......)

(02) සංක්‍රාන්තික පද සම්බන්ධයක් වන්නේ,

(1) ඒ, බී ගේ මිතුරෙකි. බී, සී ගේ මිතුරෙකි. ඒ හා සී අතර සම්බන්ධයයි.

(2) ඔහු තම මිතුරාට වඩා අඟලක් උසය යන්නය.

(3) නුවර සිට කොළඹට සැතපුම් 72 ක් ද, කොළඹ සිට ගාල්ලට සැතපුම් 72 ක් ද වන විට නුවර ගාල්ල අතර පවතින දුරයි.

(4) ඉන්දියාව ලංකාවට උතුරින් ද, චීනය ඉන්දියාවට උතුරින් ද පිහිටි බව පැවසෙන විට ලංකාව හා චීනය අතර සම්බන්ධයයි.

(5) කමලා නිමලාගේ පන්තියේ ය. නිමලා අචලාගේ පන්තියේ ය. එම නිසා කමලා අචලාගේ පන්තියේ ය. (......)

(03) රූපය අතින් හෝ අර්ථය අතින් වාච්‍යයම නැවත වරක් වාචකය මඟින් විස්තර කෙරෙන ප්‍රස්තුත,

(1) විසංවාදී ප්‍රස්තුතය. (2) විශ්ලේෂී ප්‍රස්තුතය. (3) ගණිතමය ප්‍රස්තුතය.

(4) රූපික ප්‍රස්තුතය. (5) සංශ්ලේෂී ප්‍රස්තුතය. (......)

(04) ප්‍රස්තුත ප්‍රතියෝගය ඇසුරින් වඩා නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) ප්‍රත්‍යනීක ප්‍රස්තුත දෙකක් එකවිට සත්‍ය විය නොහැකි වන අතර, දෙකම එකවර අසත්‍ය විය හැකිය.

(2) A සත්‍ය වන විට I නිශ්චය කළ නොහැකිය.

(3) E වල විසංවාදී A ප්‍රස්තුතය යි.

(4) විසංවාදී පද යුගලයක් එකවර සත්‍ය විය හැකිය.

(5) උප ප්‍රත්‍යනිකයට අනුව I සත්‍ය නම් O අසත්‍ය වේ. (......)

(05) ''බුද්ධිමතුන් හැර කිසිවෙක් රට හැර නොයතී'' යන්නෙන් ''රට හැර යන සමහර දෙනා බුද්ධිමතුන් බව'' ගම්‍ය වේ. මේ ප්‍රකාශයට අදාළ පිළිතුර,

(1) නිවැරදිය. (2) නිශ්චය කළ නොහැක.

(3) E සත්‍ය වන විට I අසත්‍ය වේ. (4) A සත්‍ය වන විට I අසත්‍ය වේ.

(5) O සත්‍ය වන විට I අසත්‍ය වේ.

(06) සියලුම මිනිසුන් බුද්ධිමත් වන හෙයින්, කිසිම බුද්ධිමත් නොවන අයෙක් මිනිසෙක් නොවේ. මීට අදාළ ආනයනය,

(1) ප්‍රති වර්තනයයි. (2) පරස්ථාපනයයි. (3) ප්‍රතිවර්ත්‍ය පරිවර්තනයයි.
(4) පරිවර්තනයයි. (5) ප්‍රතිලෝමනයයි. (......)

(07) සියලු S, P වන කළ සියලු P, S වේ යන්න ආනයනයන් අනුව කුමන ආභාෂයට අයත් වේද?

(1) අයථා ප්‍රතිවර්තන ආභාසය. (2) අයථා පරස්ථාපන ආභාසය.
(3) අයථා පරිවර්තන ආභාසය. (4) අයථා ප්‍රතිලෝමනය.
(5) අයථා ප්‍රතිවර්තන පරිවර්තන ආභාසය. (......)

(08) එක්කෝ P තිබේ. නැත්නම් Q තිබේ. P නොතිබේ. එහෙයින් Q තිබේ. මේ තර්කය,

(1) සරල අසත්‍යාත්මක උභතෝකෝටිකයකි.
(2) සංකීර්ණ අසත්‍යාත්මක උභතෝකෝටිකයකි.
(3) අමිශ්‍ර වියෝජක සංවාක්‍යයි.
(4) මිශ්‍ර වියෝජක සංවාක්‍යයි.
(5) මිශ්‍ර සෝපාධික සංවාක්‍යයි. (......)

(09) සංවාක්‍යයක අවයව දෙකම විශේෂ ප්‍රතිජානන ප්‍රස්තුත වූ විට ඇතිවන ආභාෂය වන්නේ,

(1) අයථා සාධ්‍ය පද ආභාසය. (2) අයථා පක්ෂ පද ආභාසය.
(3) අයථා මධ්‍ය පද ආභාසය. (4) අව්‍යාප්ත මධ්‍ය පද ආභාසය.
(5) අ ව ්‍ය ා ප ් ත ප ක ් ෂ ප ද ආ ා භ ා ස ය . (......)

(10) පහත සඳහන් ප්‍රකාශයන්ගේ නිවැරදි ප්‍රකාශය වන්නේ,

(1) අවශ්‍යයෙන්ම සත්‍යවන ප්‍රස්තුත සියල්ල විශ්ලේෂී වේ.
(2) සංශ්ලේශී ප්‍රස්තුතයක නිශේධනය විසංවාදී වන්නේ නැත.
(3) අර්ථවත් වාක්‍ය සියල්ල ප්‍රස්තුත වේ.
(4) ස්වදේශික විදේශික යන පද යුගලය ප්‍රත්‍යනික වේ.
(5) එක්කෝ රාමා රජෙකි. නැත්නම් රාවනා රජෙක් වේ යන්න අවශ්‍යයෙන්ම සත්‍යය. (......)

(11) පද යුගලයක් එකවර සත්‍ය විය නොහැකි මුත් එකවර අසත්‍ය විය හැකිය.

(1) නිරපේක්ෂ පද යුගල (2) විසංවාදී පද යුගල (3) ප්‍රත්‍යනික පද යුගල
(4) සංපේක්ෂ පද යුගල (5) සමමිතික පද යුගල (......)

(12) A ගේ පියා B වේ. මේ සම්බන්ධය කුමක් ද?

(1) සමමිතික (2) අසමමිතික (3) සංක්‍රාම්‍ය
(4) අසංක්‍රාම්‍ය (5) මේ එකක්වත් නොවේ. (......)

(13) එකාධිවාචී ප්‍රස්තුතයක් වන්නේ,

(1) ශිෂ්‍යා දක්ෂයෙක් වේ. (2) හාවුන් කොළ පාට නොවේ.
(3) සියලු මල් පියකරු වේ. (4) බොහෝ ගැහැණු කටකාරය.
(5) ශිෂ්‍යයන් දක්ෂයන් නොවේ. (......)

(14) අර සුරංගනාවිය ........... පදයකි.

(1) ඒකවාචී (2) සාමාන්‍ය (3) ප්‍රත්‍යනික

(15) සංවාක්‍ය සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය වන්නේ,

(1) නිගමනය ප්‍රතිජානන ප්‍රස්තුතයක් විය යුතුය.
(2) නිගමනයේ දී මධ්‍යපදය ව්‍යාප්ත වේ.
(3) අවයව ප්‍රස්තුත තුනක් ඇත.
(4) අවයව දෙකෙහි පොදු පදයක් තිබිය යුතුය.
(5) ප්‍රතිශෝධන ප්‍රස්තුතයක් තිබිය යුතුය. (......)

(16) දෙවර බැගින් යෙදුනු පද තුනක් තිබිය යුතුය යන්න,

(1) ප්‍රමාණය සම්බන්ධ රීතියකි. (2) ගුණය සම්බන්ධ රීතියකි.
(3) ස්වරූපය සම්බන්ධ රීතියකි. (4) සංවාක්‍යමය රීතියකි.
(5) පද ව්‍යාප්තිය සම්බන්ධ රීතියකි. (......)

(17) දිමාරිස් (DIMARIS) අයත්වන ප්‍රකාරය වනුයේ,

(1) පළමු උපප්‍රකාරය. (2) දෙවන උපප්‍රකාරය. (3) තෙවන උපප්‍රකාරය.
(4) සිව්වන උපප්‍රකාරය. (5) පස්වන උපප්‍රකාරය. (......)

(18) සමහර පළතුරු පැණි රස නම් පැණි රස සියලු දේ පළතුරුය යන්න,

(1) සප්‍රමාණය.
(2) නිෂ්ප්‍රමාණ අයථා පරිවර්තනයකි.
(3) නිෂ්ප්‍රමාණ අයථා ප්‍රතිවර්තනයකි.
(4) නිෂ්ප්‍රමාණ අයථා ප්‍රතිලෝමනයකි.
(5) සප්‍රමාණ ප්‍රතිලෝමනයකි. (......)

(19) මිශ්‍ර සෝපාධික සංවාක්‍යයක් සප්‍රමාණවීමට නම් එය අනුකූල විය යුත්තේ,

(1) අස්ති ප්‍රකාර රීතියට (2) නාස්ති ප්‍රකාර රීතියට
(3) නාස්ති අස්ති ප්‍රකාර රීතියට (4) අස්ති නාස්ති ප්‍රකාර රීතියට
(5) අස්ති ප්‍රකාර රීතිය හෝ නාස්ති ප්‍රකාර රීතියට (......)

(20) භූගර්භ විද්‍යාව.....,

(1) රසායනික විද්‍යාවකි. (2) භෞතික විද්‍යාවකි. (3) පුරා විද්‍යාවකි.
(4) ජීව විද්‍යාවකි. (5) ඇගයුම්ශීලී විද්‍යාවකි. (......)

(21) ග්‍රහවස්තු ගමන් ගන්නේ ඉලිප්සාකාර කක්ෂයක බව සොයා ගත්තේ,

(1) එඩ්මන් හේලී (2) ටොලමී (3) නිකලස් කොපර්නිකස්
(4) පයිතගරස් (5) ජොහැන්නස් කෙප්ලර් (......)

(22) ඔහු දක්ෂ වුවොත් මිස අවංකවේ යන්න,

(1) සෝපාධික ප්‍රස්තුතයකි. (2) නිරුපාදික ප්‍රස්තුතයකි.
(3) වියෝජක ප්‍රස්තුතයකි. (4) ප්‍රබල වියෝජක ප්‍රස්තුතයකි.
(5) මේ එකක්වත් නොවේ. (......)

(23) සාමාන්‍ය ප්‍රස්තුතයක වාච්‍ය හැම විටම ....... වේ,

(1) අව්‍යාප්ත වේ. (2) ව්‍යාප්ත වේ. (3) ප්‍රතිජානන වේ.
(4) නිශේධන වේ. (5) ඒකාධිවාචී වේ. (......)

(24) කවන්ධ රූපයේ හිස පැත්තට ඇලවී ඇත යන්න,

(1) සංස්ලේෂී ප්‍රස්තුතයකි. (2) විශ්ලේෂී ප්‍රස්තුතයකි. (3) විසංවාදී ප්‍රස්තුතයකි.
(4) පුනර්වාචී ප්‍රස්තුතයකි. (5) අවශ්‍ය සත්‍ය ප්‍රස්තුතයකි. (......)

(25) තාර්කික පදයක තිබිය හැකි අර්ථ,

(1) ප්‍රස්තුතයක වාච්‍ය පමණක් සැලකේ.

(2) ප්‍රස්තුතයක වාචකය පමණක් සැලකේ.

(3) ප්‍රස්තුතයක ඇඳුම පමණක් සැලකේ.

(4) ප්‍රස්තුතයක ප්‍රමාණ ලකුණ පමණක් සැලකේ.

(5) ප්‍රස්තුතයක වාච්‍ය හා වාචකය යන දෙකම පමණක් සැලකේ. (......)

(26) තාර්කික පදයක ඇති වචන ගණන,

(1) එකක් පමණි. (2) දෙකක් පමණි. (3) එකක් හෝ දෙකක් පමණි.

(4) තුනක් පමණි. (5) ඉහත පිළිතුරු සියල්ලම වැරදිය. (......)

(27) ප්‍රස්තුතයක ඇති තාර්කික පද ගණන,

(1) එකකි. (2) දෙකකි. (3) තුනකි.

(4) හතරකි. (5) ඕනෑම ගණනක් විය හැකිය. (......)

(28) ප්‍රස්තුතයක ඇති තාර්කිත පද ලෙස නොසැලකෙන්නේ,

(1) වාච්‍ය (2) ප්‍රමාණ ලකුණ (3) ඇඳුම

(4) වාචකය (5) 2 සහ 3 (......)

(29) ප්‍රස්තුතයක වාච්‍ය පදය අයත් වර්ගයෙන් සියල්ලම නියෝජනය කෙරේ ද? කොටසක් නියෝජනය කෙරේ ද යන්න තීරණය වන්නේ,

(1) වාච්‍ය මගිනි. (2) වාචකය මගිනි. (3) වස්තු විෂය මගිනි.

(4) ගුණාර්ථය මගිනි. (5) ප්‍රමාණ ලකුණ මගිනි. (......)

(30) ප්‍රස්තුතයක වාච්‍ය හා වාචකය අතර සම්බන්ධයක් ඇති බව හෝ නැති බව ප්‍රකාශ වන්නේ,

(1) අස්ත්‍යාර්ථයෙනි. (2) නාස්ත්‍යාර්ථයෙනි. (3) ඇඳුම මගිනි.

(4) ප්‍රමාණ ලකුණ මගිනි. (5) ඉහත කී කිසිවක් නොවේ. (......)

(31) පදයකින් ඇඟවෙන පුද්ගලයන්, ස්ථාන, ද්‍රව්‍ය ආදී දේවල් පිළිබඳ අදහස එකී පදයෙනි,

(1) වස්තු අර්ථයයි. (2) ගුණාර්ථයයි. (3) නිරපේක්ෂ බවයි.

(4) සාපේක්ෂ බවයි. (5) 1 හා 2 පිළිතුරු නිවැරදියි. (......)

(32) වස්තුවක් හෝ වස්තු සමූහයක් අනෙකුත් වස්තූන්ගෙන් වෙන්කොට හඳුනාගැනීම සඳහාත්, එසේ හඳුනාගැනීමට ප්‍රමාණවත් සේ ගැනෙන මූලික ගුණය හෝ ගුණ සමූහයත් එකී පදයෙහි,

(1) ප්‍රමාණයයි. (2) ව්‍යාප්තියයි. (3) විභජනයයි.

(4) ගුණාර්ථයයි. (5) නිර්වචනයයි. (......)

(33) ගුණාර්ථයක් නොමැති පද ලෙස හැඳින්වේ.

(1) සංයුක්ත පද (2) වියුක්ත පද (3) සංඥානාම පද

(4) වෛකල්‍යවාචී පද (5) භාවසූචක පද (......)

(34) සමහර මල් පියකරු නිසා කිසිම මල් පියකරු නොවේ යන්න අසත්‍ය වන්නේ,

(1) ප්‍රත්‍යනීක ප්‍රතියෝගයේදී ය. (2) උපාශ්‍රයන ප්‍රතියෝගයේදී ය.

(3) විසංවාදී ප්‍රතියෝගයේදී ය. (4) උපප්‍රත්‍යනික ප්‍රතියෝගයේදී ය.

(5) ප්‍රස්තුත ප්‍රතියෝගයේදී ය. (......)

(35) වාක්‍යයේ ප්‍රමාණය වෙනස් නොකර ගුණය වෙනස් කිරීමෙන් වෙනත් ප්‍රස්තුතයක් ගම්‍ය කර ගත හැකි වන්නේ,

(1) ප්‍රතිවර්ථනයේ දීය. (2) පරිවර්තනයේ දී ය.
(3) ප්‍රතිවර්ත්‍ය පරස්ථාපනයේදී ය. (4) පරස්ථාපනයේ දී ය.
(5) ප්‍රතිලෝමනයේ දී ය. (......)

(36) පහත සඳහන් ආකෘති අතුරින් සප්‍රමාණ සංවාක්‍ය ආකෘතිය වන්නේ,

| (1) | (2) | (3) | (4) | (5) |
|---|---|---|---|---|
| PM A | PM O | MP A | PM E | MO A |
| MS A | SM A | SM I | SM E | SM I |
| ∴ SP A | ∴ SP A | ∴ SP I | ∴ SP E | ∴ SP A |

(......)

(37) සමහර දේවල් රසවත්ය යන ප්‍රස්තුතය සඳහා වඩාත් නිවැරදි සංකේතකරණය වන්නේ,

(1) $AB = Q$ (2) $A\overline{B} \neq Q$ (3) $A = Q$ (4) $A \neq Q$ (5) $AB \neq Q$ (......)

(38) ඉගෙනීමට දක්ෂ සමහර අය ක්‍රීඩා වලට දක්ෂ නොවේ යන ප්‍රකාශය සත්‍ය නම් වර්ග තර්කවලට අනුව පහත කුමන ප්‍රකාශය සප්‍රමාණ වේ ද?

(1) ඉගෙනීමට දක්ෂ අය සිටී.
(2) ක්‍රීඩාවට දක්ෂ අය සිටී.
(3) ක්‍රීඩාවලට දක්ෂ සියලු දෙනා ඉගෙනීමට ද දක්ෂ වේ.
(4) ඉගෙනීමට දක්ෂ සියලු දෙනා ක්‍රීඩාවලට ද දක්ෂ වේ.
(5) ක්‍රීඩාවලට ද දක්ෂ නැති ඉගෙනීමට ද දක්ෂ නැති අය සිටී. (......)

(39) පහත දක්වෙන ප්‍රකාශ වලින් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) A, B ගේ සහෝදරයා නම් අනිවාර්යෙන්ම B, A ගේ සහෝදරයා වේ.
(2) සියලු මුවන් අහිංසක නම් සියලු අහිංසක අය මුවන් නොවේ.
(3) එක් විකල්පයක් සත්‍ය වූ පමණින් වියෝජක වාක්‍යයක සත්‍යතාවය නිගමනය කළ නොහැක.
(4) සියලු උභතෝකෝටික තර්ක නිෂ්ප්‍රමාණ වේ.
(5) සංයෝජක ප්‍රකාශනයක් අසත්‍ය යැයි නිගමනය කිරීමට එක් සංඝටකයක අසත්‍යය බව සෑහේ.

(......)

(40) කාල් පොපර්ගේ අසත්‍යකරණ රීතියට අනුව විද්‍යාත්මක ප්‍රකාශනයක් වන්නේ,

(1) ත්‍රිකෝණයට පැති තුනක් ඇත.
(2) එක්කෝ පේරාදෙණියට වහී. නැත්නම් වහින්නේ නැත.
(3) ඔබට ලොතරැයි දිනුමකට ඉඩ ඇත.
(4) මරණින් මතු යළි ඉපදේ.
(5) රත් කළ විට වායුව ප්‍රසාරණය වේ. (......)

(41) සමාජයීය විද්‍යාවන්හි දී මෙන්ම ස්වභාවික විද්‍යාවන්හි දී ද යොදා ගත හැකි පරීක්ෂණ ක්‍රමයක් වන්නේ,

(1) පරමාදර්ශී සම්පරීක්ෂණය (2) පාලිත කණ්ඩායම් ක්‍රමය.
(3) සම්මුඛ සාකච්ඡා ක්‍රමය. (4) නිර්ණය පරීක්ෂණය.
(5) ප්‍රත්‍යක්ෂ පරීක්ෂණ ක්‍රමය. (......)

The National e-Learning Portal for The General Education

(42) ප්‍රාථමික වර්ගයේ ලුප්ත සංවාක්‍යයක් නොවන්නේ,

(1) කිසිම පරිපූර්ණ වූවක් භෞතික වස්තුවක් නොවේ. කිසිම චලනය වන දෙයක් පරිපූර්ණ නොවන බැවිනි.

(2) සමහර වෙළෙන්දෝ කැබිනට් ඇමතිවරු හෙයින් සමහර වෙළෙන්දෝ ජනතා නියෝජිතයෝ ය.

(3) සමහර වටිනාකමකින් යුතු දේ පිටි කිරි නොවන්නේ හැම පෝෂ්‍යදායී දෙයක්ම වටිනාකමකින් යුතු හෙයිනි.

(4) සමහර ක්‍රීඩකයෝ සහජ දක්ෂතාවයෙන් යුතු වේ. සහජ දක්ෂතාවයෙන් යුතු අය ක්‍රියාශූර වන හෙයිනි.

(5) සෑම වාක්‍යයක්ම ප්‍රස්තුතයක් නොවේ. මන්ද යත් සමහර වාක්‍ය අර්ථ ශූන්‍ය වන හෙයිනි. (......)

(43) පහත දැක්වෙන ප්‍රකාශ අතුරින් නිවැරදි ප්‍රකාශය කුමක් ද?

(1) විශ්ලේෂී ප්‍රස්තුත අවශ්‍යයෙන්ම සත්‍ය වේ.

(2) සංශ්ලේෂී ප්‍රස්තුතයක නිශේධනය විසංවාදයකි.

(3) ''මහනුවර ශ්‍රී ලංකාවේ අගනුවර වේ.'' යන්න අවශ්‍යයෙන්ම අසත්‍යයකි.

(4) විශ්ලේෂී වශයෙන් සත්‍යය ප්‍රස්තුතයක නිශේධනය විසංවාදයකි.

(5) සංශ්ලේෂී ප්‍රස්තුතයක වාචකයෙන් වාච්‍යය විශ්ලේෂණය වේ. (......)

(44) ''අ'' යටතේ දැක්වෙන විස්තරයට අනුරූපව ''ආ'' යටතේ සඳහන් ප්‍රස්තුත අනුක්‍රමය දැක්වෙන වරණය කුමක් ද?

| ''අ'' | ''ආ'' |
|---|---|
| (i) වාචකයෙන් වාච්‍ය විශ්ලේෂණය කරයි. | a. සංශ්ලේෂී ප්‍රස්තුත |
| (ii) කරුණු අනුව පවතින තත්ත්වය හා සැසඳීම කරයි. | b. නිරුපාධික ප්‍රස්තුත |
| (iii) වාචකයෙන් වාච්‍ය පිළිබඳව කොන්දේසි විරහිතව ප්‍රතිඥාව කරයි. | c. සෝපාධික ප්‍රස්තුත |
| (iv) අපරාංගය පූර්වාංගය සමඟ කොන්දේසියක් සහිතව බැඳී ඇත. | d. විශ්ලේෂී ප්‍රස්තුත |

(1) (a, b, d, c) (2) (b, a, d, c) (3) (d, a, b, c) (4) (d, a, c, d) (5) (d, b, a, c) (......)

(45) ''සමහර ළමයි බුද්ධිමත් නම් සමහර බුද්ධිමත් අය ළමයින් ය'' යන්න,

(1) සප්‍රමාණ ප්‍රතිවර්තනයකි. (2) සප්‍රමාණ පරිවර්තනයකි.

(3) නිෂ්ප්‍රමාණ ප්‍රතිලෝමනයකි. (4) නිෂ්ප්‍රමාණ පරිවර්තනයකි.

(5) සප්‍රමාණ පරස්ථාපනයකි. (......)

(46) ප්‍රතියෝග චතුරස්‍රයට අනුව I ප්‍රස්තුතයක් සත්‍ය වන විට පිළිවෙළින් A, E හා O යන ප්‍රස්තුතයන්ගෙන් සත්‍යතා ඇගයුම් වන්නේ,

(1) සත්‍යය, අවිනිශ්චිතය, සත්‍යය. (2) අසත්‍යය, සත්‍යය, අවිනිශ්චිතය.

(3) අසත්‍යය, අසත්‍යය, අසත්‍යය. (4) අවිනිශ්චිතය, අසත්‍යය, අවිනිශ්චිතය.

(5) අවිනිශ්චිතය, සත්‍යය, සත්‍යය. (......)

(47) $(P \rightarrow Q)$ යන්නට තාර්කිකව සමාන වන්නේ මින් කවරේ ද?

(48) පහත දැක්වෙන ප්‍රකාශ අතරින් නිවැරදි ප්‍රකාශය වන්නේ කුමක් ද?

(1) සාධ්‍ය අවයවය විශේෂ ප්‍රස්තුතයක්ව තිබියදී පක්ෂ අවයවය නිශේධනාත්මක වුවහොත් අයථා පක්ෂපද ආභාසය ඇතිවේ

(2) එක් අවයවයක් විශේෂ ප්‍රස්තුතයක් වන විට නිගමනය විශේෂ ප්‍රස්තුතයත් වුවහොත් සංවාක්‍යය නිෂ්ප්‍රමාණ වේ.

(3) අවයව දෙකම ප්‍රතිජානතාත්මක වුවහොත් සංවාක්‍යයක් නිශ්ප්‍රමාණ වන්නේ නැත.

(4) මධ්‍යපදය එක් අවයවයක දී හෝ ව්‍යාප්ත වුවහොත් අනිවාර්යයෙන්ම සංවාක්‍යයක් සප්‍රමාණ වේ.

(5) සප්‍රමාණ සංවාක්‍යක එක් අවයවයක් නිශේධනාත්මක වූ විට නිගමනය ප්‍රතිජානනාත්මක විය නොහැකිය. (......)

(49) සමාජයීය විද්‍යාවන්හී බෙහෙවින් යොදාගනු ලබන්නේ පහත දැක්වෙන කවර පරීක්ෂණය ද?

(1) සම්පරීක්ෂණය (2) නිරීක්ෂණය (3) නිර්ණය පරීක්ෂණය

(4) පාලිත කණ්ඩායම් ක්‍රමය (5) අන්තරාවලෝකනය (......)

(50) පහත දැක්වෙන සංකේතකරණයට අදාළ වෙන්රූප සටහන කුමක් ද?

$AB = \varnothing$

$x \notin A$

(1)



(2)



(3)



(4)



(5)



(......)

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved



# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

## තර්ක ශාස්ත්‍රය හා විද්‍යාත්මක ක්‍රමය - II

12 ශ්‍රේණිය

කාලය පැය 03 යි.

සැලකිය යුතුයි :-

- ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

---

(01) (අ) A, E, I, O යනුවෙන් කෙරෙන වර්ග කිරීම අනුව සත්‍ය අසත්‍ය, සත්‍ය අසත්‍යතාව නිශ්චය කළ නොහැකිය යන යෙදුම්වලින් සුදුසුම යෙදුම භාවිතා කරමින් පහත සඳහන් ඒවායේ හිස්තැන් පුරවන්න.

(i) I සත්‍ය බව දුන් විට E_______ A _______

(ii) E අසත්‍ය බව දුන් විට A_______ O _______

(iii) A සත්‍ය බව දුන් විට E_______ I_______ O _______

(iv) O සත්‍ය බව දුන් විට E_______ A _______ I _______ (ල.10)

(ආ) පරිවර්තනය යන්න නිර්වචනය කර පරිවර්තන රීති ලියා දක්වන්න. (ල.10)

(02) (අ) ආනයන රීතීන් අනුව පහත සඳහන් තර්ක සප්‍රමාණවේද, නිෂ්ප්‍රමාණවේද යන්න නිගමනය කරන්න. නිෂ්ප්‍රමාණ වන අවස්ථාවලදී සිදුව ඇති ආභාසයන් සප්‍රමාණ වන අවස්ථාවලදී නිවැරදිව යොදාගෙන ඇති ආනයනයත් දක්වන්න.

(i) සියලු පිරිමි ආත්මාර්ථකාමීය.
සමහර පිරිමි නොවන අය ආත්මාර්ථකාමී වේ.

(ii) සියලු පිරිමි ආත්මාර්ථකාමී නැත.
සමහර ආත්මාර්ථකාමී නොවන අය පිරිමි වේ.

(iii) කිසිම පිරිමියෙක් ආත්මාර්ථකාමී නැත.
සියලු ආත්මාර්ථකාමී අය පිරිමි වේ.

(iv) සමහර පිරිමි ආත්මාර්ථකාමී ය.
සමහර පිරිමි ආත්මාර්ථකාමී නොවන්නන් වේ.

(v) කිසිම පිරිමියෙක් ආත්මාර්ථකාමී නොවේ.
සමහර පිරිමි නොවන අය ආත්මාර්ථකාමී නොවේ. (ල.20)

(03) (අ) පහත දැක්වෙන සංවාක්‍ය සප්‍රමාණ ද, නිෂ්ප්‍රමාණ ද යන්න නිගමනය කරන්න. තර්කය නිෂ්ප්‍රමාණ වන විට යෙදී ඇති රීතිය / රීති හා සිදුව ඇති ආභාසය / ආභාස ද නම් කරන්න.

(i) ශිෂ්‍යයින් බුද්ධිමත් නොවන්නේ, සියලු බුද්ධිමතුන් කඩිසර නොවන අතර කිසිම කඩිසර අයෙකු ශිෂ්‍යයෙකු නොවන නිසාය.

(ii) රෝසමල් ලස්සන අතර ලස්සන මල් රතුය. එහෙයින් රෝස මල් රතුය.

(iii) දිව්‍යමය දේ පමණක් නියම සංගීතය වන්නේ නම් හා සමහර සිංදු දිව්‍යමය වන්නේ නම් එවිට නියම සංගීතය සිංදු වේ.

(ආ) අපරාංග ආභාසයට නිදසුනක් දෙන්න. (ල.20)

(04) උද්ගමනවාදය පැහැදිලි කර එහි දුර්වලතාවයන් සාකච්ඡා කරන්න. (ල.20)

(05) විද්‍යාවක් හා විද්‍යාවක් නොවන ක්ෂේත්‍රයක් වෙන් කර දක්වන පොපේජියානු උපමානය ලියා පහදන්න. (ල.20)

(06) පහත සඳහන් ඒවායින් දෙකක් පිළිබඳ කෙටි සටහන් ලියන්න.

(i) සිව්වැදෑරුම් ප්‍රස්තුත

(ii) සමමිතික හා අසමමිතික සම්බන්ධය

(iii) ප්‍රත්‍යනික පද හා විසංවාදී පද

(iv) සංස්ලේෂී හා විශ්ලේෂී ප්‍රස්තුත (ල.20)

The National e-learning Portal for The General Education